
8

# ජන කවි ගායනා

ඒ සිකුරාද දවසකි. සිංහල සාහිත්‍ය සංගමයේ අනුශාසිකා හර්ෂණී ධීරසේකර ගුරුතුමිය මෙසේ ප්‍රකාශ කළා ය.

"වාර්ෂික වැඩසටහන අනුව ලබන සභා වාරයේ පැවැත්වෙන්නේ **ජන කවි ගායනා**. අපේ මාතෘකාව **සතුන් ගැන කියැවෙන ජන කවි**. චරිතවලට ගැළපෙන ඇඳුමකින් සැරසී ජන කවි ඉදිරිපත් කරන්න."

✣ ✣ ✣



පසිඳු සහ විශ්වනාත් ජන කවි ගායනා ආරම්භ කළහ.

**පසිඳු** : සතුන්ගෙන් භෝග ආරක්ෂා කර ගැනීමට හේනේ පැලට වී සිටි ගැමියා පාළුව සහ කාන්සිය දුරු කර ගැනීමට අසල හේනේ සිටි ගොවියාට පැල් කවි කීමට ආරාධනා කළා.

උණ දඬු කපන තැන උණ දඬු රිකිල්ලා
බට දඬු කපන තැන බට දඬු රිකිල්ලා
වතුර බසින තැන හොල්මන් කුරුල්ලා
සීපද කියන්නට කවුරුත් වරෙල්ලා

(පැල් කවි)


**විශ්වනාත් :** යහපත් මිතුරු ඉන්නා ඔය ඉහළ පැලේ
කොහොමත් බැරි ය නවතන්නට ඌරු රැලේ
කියතොත් තදින් උන් බිය වී දුවති කැලේ
කියතොත් තරගයට සීපද කියමු පැලේ

(පැල් කවි)

.....................අත්පොළසන්....................

**ගුරුතුමිය :** අංක 2 කණ්ඩායම කරුණු ඉදිරිපත් කරන්න.
*(කාවින්ද සහ උදේනි වේදිකාවට පැමිණෙති)*

**කාවින්ද :** ගොවිතැන් කිරීමේ දී නොයෙක් ආකාරයෙන් උපකාරී වන ගවයාට හෙවත් ගොනාට ගොවියා ඉතා හොඳින් සලකනවා. ගොනාට ඉතා ආදරයෙන් කතා කර කැමති දේ කන්නට දී සිත සතුටු කරනවා. ගොයම් පාගන අවස්ථාවල දී ගවයන් සරසන සැටි මේ කමත් කවිවලින් කියවෙනවා.



මේ කොතැනින් ගෙනා ගොනා
රැහුණු රටින් ගෙනා ගොනා
කොළ මඩනට හොඳ ද ගොනා
කොළ මඩනට හොඳයි ගොනා


මුදුනේ යන ගොන් රජුනේ
ඊළඟ යන කිරි පුසිනේ
වට දුවනා නාම්බනේ
කොළ මඩවා දෙන් සොඳිනේ

**උදේනි** : අං දෙක රන් බන්දක්කැයි
කන් දෙක මේවර ලක්කැයි
හුනරේ මුතු අමුණක්කැයි
මෙ කී ලෙසට සරසක්කැයි

ගොනු යන්නේ කඳුබොඩලූ
ගලතන්නේ කලවැලලූ
පලඳින්නේ මුතු පබළු
වළඳන්නේ කිරිමදුලූ

*.................අත්පොළසන්.............*

**ගුරුතුමිය** : අංක 3 කණ්ඩායම කරුණු ඉදිරිපත් කරන්න.



*(උගුඩුවා, ගෙම්බා සහ ඉස්සා ලෙස වෙස් මුහුණු පැලඳි රොහාන්ජිත්, සලීම් සහ ෆාතිමා කරළියට අවුත් නටති.)*

කැලණි ගඟානෝ නිතරම වතුර ගලානෝ
කෙටල පටානෝ උඩ යට කෙටල පටානෝ

උගුඩු මොටානෝ දෙරකඩ කිතුලෙ නටානෝ
කෙදිරි ගගානෝ නිතර ම අප රවටානෝ

ඇටිකිති ජානෝ නිතර ම ජෙක ජෙක ගානෝ
අඩු දිග ජානෝ දිය පිට පැන පැන යානෝ

*...............සියලු දෙනා සිනාසෙති...................*

**ගුරුතුමිය** : අංක 4 කණ්ඩායම කරුණු ඉදිරිපත් කරන්න.

*(ගැමියෙකු සහ ගෙවිලියක ලෙස සැරසුණු සංකල්ප සහ සෙව්වන්දි කරළියට එති.)*



**සංකල්ප** : බොහෝ ජන කවිවලින් කියැවෙනවා, ගැමියන්ට ඌරන්, ගෝනුන් ආදීන්ගෙන් සිදු වුණු අලාභ හානි ගැන. කොතරම් පාඩු කරදර ඇති වුවත් ගැමියන් සතුන් කෙරෙහි වෛරයක් ඇති කර ගත්තේ නැහැ.

**සෙව්වන්දි** : හේනේ පැලේ මා විදිනා සුරුක්කන්
ගෝනෙක් ඇවිත් මට කරනා නරක්කන්
වැටටත් උඩින් උන් අල්ලන මලක්කන්
අපොයි මගේ කිරි වදිනා කුරක්කන්

**සංකල්ප** : අපොයි අපේ මේ අහසේ නරක්කන්
හීන් ඇඟිලි මිට මෙළවෙන කුරක්කන්
ඌරු කොලු කාපි මගෙ කිරි කුරක්කන්
කපා දියන් මගෙ නෑනේ කුරක්කන්

*(කුරක්කන් කවි)*

..................*අත්පොළසන්*..............

**ගුරුතුමිය** : අංක 5 කණ්ඩායම කරුණු ඉදිරිපත් කරන්න.

**ගනේෂ්** : බොහෝ අය සුරතල් සතුන් ඇති කරනවා. තමන් ආදරය කරන සුරතල් සතුන්ගෙන් වෙන් වීමට සිදු වීම නිසා ඇති වන ශෝකය ප්‍රකාශ කරන කවි දෙකක් අප දැන් ඉදිරිපත් කරන්නේ.



**ගනේෂ්** : මා බාලේ ඇති කළ තලගොයි පැටියා
මට තනිවට මිදුලේ පෙම් කෙළ සිටියා
උගෙ මරුවා ඇවිදින් ඌ කැටුව ගියා
නිවන් පුරේ පලයන් තලගොයි පැටියා

| | | | |
|---|---|---|---|
| **අෂ්රොෆ්** | : | එගොඩ ගොඩේ නා කණුවේ බැන්ද | ගොනා |
| | | මෙගොඩ ගොඩේ සපු කණුවේ බැන්ද | ගොනා |
| | | දෙගොඩ තලා යන වතුරට පැන්න | ගොනා |
| | | අපොයි මගේ රන්මුතු වල්ලියා | ගොනා |

*(කරත්ත කවි)*

................ *අත්පොළසන්* ................

**ගුරුතුමිය** : අංක 6 කණ්ඩායම කරුණු ඉදිරිපත් කරන්න.

**පසිඳු** : දැන් අප පැමිණ සිටින්නේ වැඩසටහනේ අවසාන ජවනිකාවටයි. මෙහි දී සුප්‍රියා, රමේෂ් සහ පවනමධු නර්තනයෙන් ද, විශාඛා සහ විමුක්ති ගායනයෙන් ද දයක වෙනවා.

**විශාඛා** : සතුන් ගැන කතා කරන විට, සතුන්ගේ ගමන් විලාස සිහි ගන්වන '**වන්නම්**' අපට අමතක කළ නොහැකි යි. අප දැන් ඉදිරිපත් කරන්නේ වඳුරන් ගැන කියවෙන '**හනුමා වන්නම**' යි.



*(වඳුරන් මෙන් සැරසුණු තුන් දෙනෙක් කරළියට පැමිණ රඟ දෙති.)*

ගිරෙන් ගිරට පැන ලැගුම් සොයා
පුබුදිමින් අරුණ කළමා
ගොර දෙමින් නැවත වට පිටින් බලති නෙක
උහුළු විහිළු පුදුමා
එයින් නැවත පල තුරින් තුරට පැන
මලින් පල ද දළුමා
අත දෙමින් රැගෙන කට කොතින් බුදිති වට
පිටින් බියැ'ති බැලුමා

දුටින් අයෙක් සට පටින් පැනුම් රැලි
පොටින් බියැ'ති බැලුමා
බය දුටින් එවිට අතුපතින් වසා මුව
ඉතින් නැතැයි පෙනුමා
මතින් උඩඟු සිත ගතින් වැඩි ව පෙර
පැතුම් විලස දරුමා
නැණයෙතින් මෙලෙස ඉසි මතින් යෙදුන් පෙර
මෙවන් වරුණ හනුමා

............. අත් පොළසන් .............

**පසිඳු** : දැන් අප ආරාධනා කරනවා සුබෝධිනී ගුරු මහත්මියට, අපේ වැඩසටහන ගැන වචන කීපයක් කතා කරන ලෙස.

**සුබෝධිනී ගුරුතුමිය** : අද අප ජන කවි ගායනා වැඩ සටහන නැරඹුවේ ඉතා සතුටින්. සතුන්ගේ ශබ්ද, ගැමියා සතුන්ට දක්වන ආදරය, ළෙන්ගතුකම, ඒ වගේ ම සතුන්ගෙන් ඇති වන කරදර ආදිය ගැන ඉතා වෙහෙස මහන්සි වී කරුණු සොයා ගෙන තිබුණා. ඒ වගේ ම ඇඳුම් පැළඳුම්, වෙස් මුහුණු ආදිය

මාර්ගයෙන් ඉතා විචිත්‍ර ලෙස කරුණු ඉදිරිපත් කළා. පන්තියේ හැම දෙනාට ම අප ඉතා ස්තුති-වන්ත වෙනවා, ජන කවිවල රස විඳීමට අවස්ථාව ලබා දීම ගැන. ඉතා ක්‍රමානුකූල ව කරුණු ගොනු කිරීමට උපදෙස් දුන් හර්ෂණී ගුරුතුමියටත් අපේ ස්තුතිය පිරිනමනවා.

**හර්ෂණී ගුරුතුමිය :** වැඩසටහන ඉදිරිපත් කළ, නැරඹූ හැම දෙනාට ම බොහොම ස්තුතියි, මෙන්න මගෙන් සුළු තෑග්ගක්, හේන්වලින් ලැබෙන රසවත් ආහාරයක්. ......... 'ඉරිඟු කරල්'. හැමෝ ම බෙදා ගෙන කන්න.



## පැහැදිලි කිරීම්

**කොළ මැඩීම** – ගොයම් පෑගීම

**හුනර** – ගොනාගේ පාදවල ලොකු කුරවලට ඉහළින් ඇති කුඩා කුර

**කිරි පුසිනේ** – ගොනා අමතන සුරතල් වදනකි.

**කලවැල්, කිරිමදුවැල්** – ගවයා කෑමට ප්‍රිය කරන වැල් වර්ග දෙකකි.

**කෙටල** – ජලාශ්‍රිත ප්‍රදේශවල වැවෙන පැළෑටියකි.

**සුරුක්කන්** – දුක, වධය

**මලක්කන්** – පිම්ම, කරණම

**නර්තනය** – නැටීම

**අරුණ** – හිරු උදා වන විට අහසෙයි ඇති වන රක්ත වර්ණය

**ඉසිමතින්** – ඍෂිවරුන්ගේ අදහස්

**වරුණ** – වර්ණනාය

**මේවර** – කනේ පලඳින ආභරණ

## අවබෝධය

1. පැල් රැකීමෙහි යෙදී සිටින ගොවියන් කවි කීමට හේතු වන කරුණු මොනවා ද?
2. ගොයම් පෑගීමට යොදා ගන්නා ගොනා සරසනු ලැබුවේ කෙසේ ද?
3. ගැමියන් සතුන්ට ආදරය කරන බව හැඟවෙන කවි පද උපුටා දක්වන්න.
4. මෙම පාඩමේ සඳහන් සතුන් වර්ග කරමින් වගුවක ලියන්න.

| සිවුපා | බහුපා |
|---|---|
| | |

5. හනුමා වන්නමෙහි විස්තර වන වඳුරන්ගේ හැසිරීම් ඔබේ වචනයෙන් කියන්න.
6. මෙම වැඩසටහනට සහභාගි වූ සිසුන්ගේ නම් ලියන්න. එක් එක් අය ඉදිරිපත් කළ ජන කවි වර්ගය කුමක් ද?

## භාෂා ක්‍රියාකාරකම්

7. සමාන තේරුම දෙන වචන දෙක බැගින් ලියන්න.

| | | | |
|---|---|---|---|
| i. වතුර | ............... | iv. රන් | ................ |
| ii. නැණ | ................. | v. හිරු | ................ |
| iii. අහස | ................. | vi. ශෝකය | ............... |

8. ගැළපෙන ක්‍රියා පද යොදා හිස් තැන් පුරවන්න.

   i. කොළ මඬිනා ගොනා සරසන ආකාරය උදේනි විස්තර .................

   ii. වන්නම්වලින් සතුන්ගේ ගමන් විලාස කියවෙන බව නටාෂා පැහැදිලි ................

   iii. සුබෝධිනී ගුරු මහත්මිය රහපෑ සිසුන්ට ස්තුති ..................

   iv. විශ්වනාත් පැල් කවි ගායනා ..................

   v. කාවින්ද කමත් කවි දෙකක් ඉදිරිපත් ............

9. "අං දෙක රන් බන්දක්කයි" යන කවියේ පද හතර ම පැහැදිලි අත් අකුරින් ලියන්න.

10. මෙහි සඳහන් වන කවිවලින් ඔබ ඉතා ප්‍රිය කරන කවිය ලියන්න. එහි තේරුම ද ලියන්න.

11. නිවැරදි අකුර යොදා හිස් තැන් පුරවන්න.

    **(ක්ද්, ක්ද, ක්දා, ඟද, ඟදා)**

| | |
|---|---|
| i. ස—ක්‍යක අකුරු | iv. පිපික්ද්— |
| ii. කපිරි—ක්‍යා සංගීතය | v. ස්පාක්ද්—ය |
| iii. සංගීත—යා | vi. අව—ච |

## පැවරුම්

1. මෙම පාඩමේ සඳහන් වන කවි විවිධ තාලවලට ගායනා කරන්න.

2. ඔන්චිලි වාරම්, රබන් පද, තේරවිලි කවි ආදී මෙහි සඳහන් නොවන ජන කවි ද ඇතුළත් කරමින් '**ජන කවි**' යන මාතෘකාව යටතේ කුඩා පොතක් සාදන්න.